" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/1 /FI/60 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.12. 27 |

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභාව
ලේකම් ( පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය ) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දරන ලද තනතුරින් වෙනත් නව තනතුරක් සඳහා ස්ථිරව මුදාහැරීම</u>

උක්ත කාරණය සම්බන්ධයෙන මා වෙත එවා ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක WPC/PSC/TRF/04/3/2-21(1) හා 2022.12.22 දිනැති ලිපියේ පිටපතක් මේ සමග ඔබ වෙත යොමුකරමි.

02. යථෝක්ත ලිපියේ සඳහන් කරුණු සම්බන්ධව ඔබේ අවධානය යොමු කරවන අතර සියළුම ස්ථිර මුදාහැරීම්වලට අදාළ කටයුතු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව උපදෙස් දී ඇති පරිදි 2022.12.31 දිනෙන් අවසන් කිරීමටත් මෙතෙක් කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් නොකළ ස්ථිර මුදාහැරීම්වලට අදාළ සියළු නිධරයන්ගේ තොරතුරු මුදාහැරීම ප්‍රමාදවීමට හේතු සමග 2023.01.10 දින හෝ ඊට පෙර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් එමගින් උපදෙස් ලබා දී ඇත.

03. මේ සම්බන්ධව ඔබ යටතේ සිටින දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් දැනුවත් කර එකී උපදෙස් පරදි කටයුතු කිරීමේ අවශ්‍යතාවය මෙයින් අවධාරණය කරන අතර මෙතෙක් කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් නොකළ ස්ථිර මුදාහැරීම්වලට අදාළ සියළු නිලධරයන්ගේ තොරතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියමිත දිනට යොමු කිරීමට හැකි වන සේ 2023.01.06 දින හෝ ඊට පෙර මා වෙත එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්.ටී.ජී. මානෙල්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත

පිටපත - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.සඳහා

විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628.10 වන මහල.ජන ජය සිටි ගොඩනැගිල්ල.නාවල පාර.රාජගිරිය | No.628.10th Floor. Jana Jaya City Building. Nawala Road.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/TRF/04/3/2-21 (I) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.12.22 |

ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දරණ ලද තනතුරින් වෙනත් නව තනතුරක් සඳහා ස්ථිරවම මුදාහැරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද මාගේ සමාංක හා 2022.10.03 දිනැති ලිපිය හා බැඳේ.

02. උක්ත ලිපියෙන් 2022.06.30 දින දක්වා සියලුම ස්ථිර මුදාහැරීම්වලට අදාළ කටයුතු 2022.12.31 දිනෙන් අවසන් කිරීමටත්, 2022.12.31 දිනෙන් පසුව ඉදිරිපත් වන ස්ථිර මුදාහැරීම් සලකා නොබැලීමටත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් ස්ථිර මුදාහැරීම්වලට අදාළව මෙතෙක් කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් නොකළ සියලුම නිලධරයන්ගේ තොරතුරු මුදාහැරීම ප්‍රමාදවීමට හේතු සමඟ 2023.01.10 දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි. මෙය අවසාන දැනුම්දීම බවත් එදිනට පසුව ඉදිරිපත් වන ස්ථිර මුදාහැරීම් අනුමත නොකිරීමටත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බව වැඩිදුරටත් දන්වමි.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

0112879613-14
ෆැක්ස් - 0112879512
ppscwptrf@sltnet.lk